# ශාසනික විලෝපන සමයේ බුදුදහමේ අභිවෘද්ධියට ගණින්නාන්සේලා විසින් ඉටුකළ මෙහෙවර

**දර්ශනපති අජිත් තල්වත්ත**

නූතන ඉතිහාස කතිකාවත තුළ ගණින්නාන්සේලාගේ මෙහෙවර එතරම් ඇගයීමකට ලක් වී නොමැත. සසුන පරිහාණියට පත්වීමෙන් පසු සියලු වත්පිළිවෙළින් ආරක්ෂා කරනු ලැබුවේ ඔවුන් විසින් ය. ක්‍රි.ව. 1753 සියම් උපසම්පදාව පිහිටුවීමට අවශ්‍ය පසුබිම ගණින්නාන්සේලා අතින් සිදු වූ බව පෙනේ. එවකට බෞද්ධාගම විනාශ කිරීම සඳහා පෘතුගීසීන් සහ ලන්දේසීන් තුළ දැඩි අවශ්‍යතාවක් පැවතිණි. බෞද්ධ සිද්ධස්ථාන, භික්ෂූන් වහන්සේලා හා බෞද්ධ ජනතාව නොයෙකුත් තාඩන පීඩන එල්ල කර විනාශ කිරීමට ඔවුන් අපේක්ෂා කළත්, එය දීර්ඝකාලීනව සිදු කිරීමට නොහැකි විය. ඒ වන විටත් බෞද්ධ ජනතාවගේ ප්‍රධාන ආරක්ෂකයා වශයෙන් කන්ද උඩරට රාජධානිය ක්‍රියා කළේය. විශේෂයෙන් ම ගණින්නාන්සේලා බෞද්ධාගමේ අභිවෘද්ධිය වෙනුවෙන් පෙනී සිටීමත් සමඟ බුදු දහමට එරෙහිව දැඩි ක්‍රියාමාර්ග ගැනීමට ඔවුන්ට නොහැකි විය. විනාශයට පත් වෙමින් තිබූ බෞද්ධාගමික සිද්ධස්ථාන රැකගනිමින් ගණින්නාන්සේලා සුවිශේෂී භූමිකාවක් ඉටු කළහ. මෙම ලිපියේ ප්‍රධාන අරමුණ වන්නේ ශාසනයේ පැවති පරිහානිදායක සමයේ ගණින්නාසේලාගේ මෙහෙවර හඳුනාගැනීම සඳහා.

ශ්‍රී ලංකාවේ සංඝ පරම්පරාවෙහි පරිහානිදායක තත්ත්වයක් මහනුවර රාජධානි සමයේ උදා විය. අතීතයේදී රජු එරෙහි වන විට ජනතාව භික්ෂූන්ගේ පාර්ශ්වයේ සිටි අතර,ජනතාව අසීරුවට පත්වන අවස්ථාවලදී රජතුමා භික්ෂුවගේ සහයට ඉදිරිපත් වීම සාමාන්‍ය ලක්ෂණයක් බවට පත්විය. එනමුත් අප මුලින් පෙන්වා දුන් පරිදි භික්ෂුව ද හුදකලා විය. රජතුමාත් ජනතාවත් එකිනෙකාට විශේෂිත වූ අර්බුදවලට කොටු වී සිටීම ඊට හේතු විය. මින් පෙර සිදු නොවූ අන්දමින් සංඝ සමාජය වැනසී ගිය අතර, සංඝයා වහන්සේ

ප්‍රතිපත්තිවලින් පවා බිඳවැටුනේත් එබඳු වාතාවරණයක් තුළය.[1] මෙවැනි පසුබිමක් තුළ භික්ෂු ජීවිතයේ අරමුණු වෙනස් විය. සිල් රැකීම, භාවනා කිරීම, ධර්ම දේශනා කිරීම, පොත පත පරිහරණය මෙන්ම ග්‍රන්ථ රචනා කිරීම යනාදි භික්ෂූන් වහන්සේලා විසින් ඉටුකළ කාර්යයන් ක්‍රමිකව පිරිහෙන ලදි. සංඝ යන පදයෙන් හඳුන්වන ලද උත්තරීතර ගුණාංගවලින් මුළුමනින් ම බැහැර වූ ගිහිකමටත්, පැවිදි කමටත් දෙකට ම නැති භික්ෂු පිරිසක් මෙම කාලය තුළ බිහිවිය. ඔවුන් හඳුන්වා ඇත්තේ ගණින්, ගණින්නාන්සේ, ගණොල්ලෝ, ගණයි, ගණවොලින් යන නම්වලිනි.[2] බුද්ධාගම මෙරට ආරම්භ වූ දා පටන් රාජ අනුග්‍රහය මත පදනම් විය. එම අනුග්‍රහය නොතිබුණ විට බුද්ධාගම පිරිහුනේ ය. නමුත් බෞද්ධ විහාර කේන්ද්‍රගතව විශාල වශයෙන් දේපල පැවති අතර ඒවා රැකීම සඳහා පිරිසක් අවශ්‍ය විය. උඩරට පන්සල් ආශ්‍රයෙන් දේපල බහුලව පැවති අතර පහතරට එවෙනි තත්ත්වයක් දක්නට ලැබුණේ නැත. මෙවැනි පසුබිමක් තුළ ගණින්නාන්සේගේ මෙහෙවර ඉදිරියට පැමිණි බව කිව හැකිය.

ගණින්නාන්සේ පිළිබඳව තොරතුරු මහනුවර යුගයේ රචිත ***සඟරජවත*** සහ ***මන්දාරම්පුර පුවත*** නැමැති පද්‍ය ග්‍රන්ථයන්හි දක්නට ලැබේ.

ගණින්නාන්සේ යනු කවරෙක් ද යන්න පළමුව හඳුනාගත යුතු වේ. ***සිංහල විශ්ව කෝෂයට*** අනුව ගණින්නාන්සේ යනු "භික්ෂු ප්‍රතිපත්තියෙහි පිරිහී ගියා වූ උපසම්පදා නොවූ පිරිස" වශයෙන් හඳුන්වා ඇත. උපසම්පදා භික්ෂූන් නැති වූ පසු ඉතිරිව සිටි මහණ පැවිද්දන්ට කියූ නම ගණින්නාන්සේ බව ශ්‍රී සෝරත හිමියෝ පවසති.[3]

මහනුවර රාජධානී සමයේ සිරකරුවෙකු වශයෙන් සිට ඉතා වැදගත් ඓතිහාසික තොරතුරු රාශියක් ***එදා හෙළදිව*** කෘතියේ

රොබට් නොක්ස් සඳහන් කර තිබේ. එම කෘතියේ ගණින්නාන්සේගේ ස්වභාවය මෙසේ විස්තර කර ඇත."සිවුරක් පොරවාගෙන ඊට උඩින් පටියක් බැඳීම ගණින්නාන්සේලාගේ සාමාන්‍ය ඇඳුම වූ අතර සමහරුන් යටින් කසාවතත් ඇඳ ඊට උඩින් සුදු රෙද්දක් ඇඳ සිටි බව පෙනේ."[4]

***කඩඉම් සිටවුවට*** අනුව ගණින්නාන්සේ යනුවෙන් පෙන්වා ඇත්තේ දේපල පුද්ගලිකව පරිහරණය කරමින් ඒවා පාරම්පරිකව තම ඥාතීන්ට උරුමකර දීමට කටයුතු කළ, දේපල උරුමය පවත්වාගෙන යාමට ඥාති ශිෂ්‍ය ක්‍රමය පවත්වාගෙන ගිය පිරිසක් වශයෙනි. ලබුගම ලංකානන්ද හිමියන් විසින් සංස්කරණය කරන ලද ***මන්දාරම්පුර පුවතෙහි*** සඳහන් වන පරිදි "ගණින්නාන්සේ යනු ගිහියනට වඩින, බෙර ගසා නටන, කඳ මල්ල ආදි පිළි අපුල්ලා දෙන තොවිල්, ඇනවුම් කරන, දිය මසුන් මරණ, ගිහි මෙහෙකරණ මහණ පිරිසක් ලෙසයි".

ඉහත සඳහන් තොරතුරු දෙස සුපරීක්ෂාකාරීව විමර්ශනය කිරීමේදී අවබෝධ වන්නේ ගණින්නාන්සේ යනු දුශ්ශීලි ගති පැවතුම් ඇති පිරිසක් බවයි. ගණින්නාන්සේ සම්බන්ධයෙන් නූතන ඉතිහාස කතිකාව තුළ ප්‍රබල ස්ථානයක් ලබාදීමට අපොහොසත් වුවත්, පරිහානි යුගයේ ශාසනික වත්පිළිවෙත් ආරක්ෂා කරනු ලැබුවේ ඔවුන් විසින් බව අවධාරණය කළ යුතු වේ. ගණ යන්න සංඝ සමාජයේ නිශ්චිත සමූහයක් හැඳින්වීම සඳහා විනය පිටකයෙහි යෙදෙන වචනයකි.[5] විනය කර්මයට ප්‍රමාණවත් භික්ෂු පිරිස, උපසම්පදා විනය කර්මයට ප්‍රමාණවත් භික්ෂු පිරිස, එක් ධර්ම කාණ්ඩයක් ප්‍රගුණ කරන සමූහය හැඳින්වීම ගණ යන පදය ධර්ම විනය ග්‍රන්ථවලදී අපට හමුවේ. වංසකථාවන්හි ගණ යන පදය යොදා ඇත්තේ එක් භික්ෂු සමූහයක් හෝ එක්ව ජීවත් වන භික්ෂු සමූහයක් හෝ යන තේරුම් ඇති ගණවාසිනෝ යන වචනයෙනි. මහාචාර්ය විල්හෙල්ම් ගෛගර් මහතා ගණ යන පදය අර්ථ දක්වා ඇත්තේ එක්ව ආරාමයක වසමින්,

ආරාමික වතාවත්හි යෙදෙන භික්ෂු සමූහයක් ලෙසයි.[6] පොළොන්නරු යුගයේ අවසාන කාලය වනවිට ගණ යන වචනය කිසියම් නිශ්චිත තේරුමක් ඇතිව වෙනත් අර්ථයන් සඳහා යෙදුණ බව පෙනේ. මෙම යුගයේදී ගණ ලෙස හැඳින් වූයේ එක් මහාස්ථවිරයන් වහන්සේ නමක් යටතේ පැවති භික්ෂු සමූහ අටකි. *රාජාවලිය* නම් කෘතියෙහි ගණ යන වචනය බහුලව භාවිත කර ඇත. එම කෘතියට අනුව "ගණ" වචනය යෙදුනේ භික්ෂු ආරාමයක් හෝ භික්ෂු සමූහයක් හැඳින්වීමට ය.

මහනුවර යුගය වන විට ගණ යන පදය යොදා ඇත්තේ එම අර්ථයෙන් නොවේ. එහිදී අදහස් කරනු ලබන්නේ අනුපසම්පන්න හෙවත් සාමණේර අයෙකි. එහි අවඥාසහගත අර්ථයක් ලෙස දැක්විය හැක. එනම් දුෂ්ප්‍රතිපත්ති, දුශ්ශීල තැනැත්තා යන බවක් ද හඟවෙයි. ඇතැම් විට ඔහු භික්ෂු ප්‍රතිරූපකයෙකු බව පෙනේ. මොහුන්ගෙන් සමහරෙකු සිවුරු පොරවා ඒ මතුපිටින් සුදු රෙද්දක් හැඳ සිටි බවට රොබට් නොක්ස් සඳහන් කරයි. හිස මුඩු කර තිබූ ඔවුහු ගමන් බිමන් යන විට ලී මිටක් සවි කළ වටාපතක් ගෙන ගියහ. අඹුදරුවන් පෝෂණය කිරීම ගණින්නාන්සේට තහනම් වූ බව රොබට් නොක්ස් සඳහන් කළ ද[7] *උඩරට විත්ති* නම් ග්‍රන්ථයෙහි ගණින්නැහැලා කාමභෝගි ජිවිත ගත කරමින් අඹුදරුවන් ආරක්ෂා කළ පිරිසක් බවට පෙන්වා දේ.

බෞද්ධ විහාරස්ථාන බටහිර ජාතින්ගේ බලපෑම නිසා විනාශවීමත් සමඟ ම ඒවා ආරක්ෂා කිරීම අතිශයින් දුෂ්කර විය. මේ බව හොඳින් අවබෝධකරගත් ගණින්නාන්සේ විහාරස්ථානය ආසන්නයේ ම නිවසක් ඉදිකරගෙන තිබේ. ඉඩම් හිමි ධනවත් පිරිසක් වූ මොවුහු එදා සමාජයේ සෑහෙන බලපරාක්‍රමයකින් යුක්ත අධිපති ප්‍රභූ පන්තියක් වූහ. ගණින්නාන්සේලා ජීවත් වූ නිවාසය ගණේගෙදර, ගණේ වලව්ව, විහාර ගෙදර, විහාරේ වලව්ව ද යන නම්වලින් හඳුන්වා ඇත.[8] මොවුන් විසින් පෝෂණය කළ තමන්ගේ දරුවන් "ගණ ගැටයෝ" "ගණ ගැටිස්සියෝ" යන නම්වලින් හඳුන්වා තිබේ.

සාමාන්‍ය ගිහියන් මෙන් ජීවත්වීමේදී ඔවුහු විවිධ රැකියාවන් කළහ. එසේ රැකියාවන්හි නිරතවන්නට ඇත්තේ ප්‍රස්තුත කාලපරිච්ඡේදය තුළ දී භික්ෂූන් වහන්සේලාගේ දිවි පැවැත්ම පවා අවිනිශ්චිත තත්ත්වයක පැවති නිසාය. ඔවුන් සතු රැකියා අතර ඉඩම් පාලනය, නැකැත් කීම, වෙදකම් කිරීම, යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් කිරීම, දරුවනට ශබ්ද ශාස්ත්‍රය ඉගැන්වීම සහ දිසාපති, බස්නායක ලේකම් වැනි උසස් තනතුරු මෙන්ම රාජ්‍ය තාන්ත්‍රික දූත මෙහෙවරවල පවා යෙදී සිටි බවට වාර්තා තිබේ.[9] ඒ ඒ කුලවලින් පැවිදි වීමෙන් පසුව ද ඒ කුලවලට අයත් රැකියාවල නිරත වී ඇත. උදාහරණ වශයෙන් රෙදි සේදීම, කත් ඇඳීම, බෙර වාදනය හා නැටීම සඳහන් කළ හැකිය.

මෙකල ජීවත් වූ ගණින්නාන්සේ විසින් සිදු කළ වෘත්තීන් පිළිබඳව තවදුරටත් හඳුනාගත යුතුය. ***කඩදොර සීට්ටුවේ*** ගණින්නාන්සේ ගොවිතැනෙහි නිරත වූ බවට මෙසේ ඉගියක් ලබා දේ.

"සබරගමු දිසාවෙන් මැද කොරළේ බද හෙළ උඩ පළාතෙන් වෙලාගේ කියන ගමෙන් අඩි අරාව, මැද අරාව යක් දෙස්සා අරාව ඇතුළුව මුල බීජ සෙලමුනේ වපසරිය වෙලෙගේගනෙන් වහන්සේ අතින් කණුමුල් උදුරා ආපසද්ද"....

අනුරාධපුරයේ මහා විහාරය කේන්ද්‍රකරගනිමින් මෙරට ආරම්භ වූ ගිහි පැවිදි පන්සල් අධ්‍යාපනය මෙම යුගය වනවිට යම් පසුබෑමකට ලක්ව තිබුණි. එම පසුගාමී තත්ත්වය ආරක්ෂා කරමින් පන්සල්වල වාසය කළ ගණින්නාන්සේලා බණ දහම් වෙනුවට ගර්හිත විද්‍යාව පුරුදු පුහුණු කළ බවට හැරම්ටිගල ධීරානන්ද හිමියන් විසින් සංස්කරණය කළ ***සිංහල විමාන වස්තු ප්‍රකරණය*** නම් කෘතියේ සඳහන් කර තිබේ.

ක්‍රි.පූ. 3 වැනි සියවසේ බෞද්ධාගම මෙරට සමාජයේ ස්ථාපිත වීමට පෙර රජුට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කිරීමේ කාර්යෙහි නිරත වූයේ බ්‍රාහ්මණයන් විසින් බව විජය හා පණ්ඩුකාභය රාජ්‍ය

පාලන සමය තුළින් පැහැදිලි වේ. බුදුදහම මෙරට සමාජයේ ස්ථාපිතවීමත් සමඟ එම කාර්ය භික්ෂූන් වහන්සේට පැවරුණි. මෙම යුගය වනවිට භික්ෂූන් වහන්සේ පෙර කළ මෙහෙය යම් ප්‍රමාණයකට හෝ ගණින්නාන්සේගෙන් ඉටු වූ බව පෙනේ. රජයට සම්බන්ධව සිටි ගණින්නාන්සේලා ගැන හඳුනාගැනීමේදී දෙවන රාජසිංහ (ක්‍රි. ව.1629-1687) අවධියේ මහනුවර සිට ලන්දේසීන් වෙත යවන ලද දූත ගමනේ ප්‍රධානියා ලෙස කටයුතු කළේ පෝයමළු විහාරයේ ගණින්නාන්සේ ය.[10] මෙම යුගයේ සමහර ගණින්නාන්සේලා වැටුප් ලබන තනතුරු භාරගෙන පෞද්ගලික ආදායම් ද ලබාගත්හ.[11] අවසන් සිංහල රජු වූ වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ සමයේදී පුත්තලම ප්‍රදේශයේ දිසාපති පදවිය ද උඩුනුවර සිව්දේවාල බස්නායක නිළමේ ලෙස ක්‍රියා කළේ පෝයමළු විහාරයේ කොබ්බෑකඩුවේ ගණින්නාන්සේ ය. කීර්ති ශ්‍රී රාජසිංහගේ රාජාභිෂේකය ලේඛනාරූඪ කර ඇත්තේ ද මෙම ගණින්නැහැ විසිනි.[12] මෙම රජුගේ රාජ්‍ය සමයේදී ශ්‍රී මහා බෝධීන් වහන්සේ පිහිටි ස්ථානය වල් බිහිවී තිබුණු හෙයින් වනසතුන්ගෙන් බෝධියට අනතුරු සිදුවන්නට විය. එය වලක්වාගැනීම පිණිස බෝධිය වටා ප්‍රාකාරයක් බඳවන ලෙස ඉලිපැන්දෙණියේ ගණින්නාන්සේ රජතුමාට සැල කළේය. රජතුමා ඒ හිමි නමට නුවර කලාවියේ දිසාපති තනතුර පවරා නිල බලයෙන් මිනිසුන් ලවා ප්‍රාකාරය බඳවාගන්නා ලෙස නියම කළේය.[13] මෙයින් පෙනීයන්නේ එකල ගණින්නාන්සේ ගිහියන් මෙන් රාජකාරි කටයුතුවල ද යෙදුණු බවයි. තවද දිවයිනේ විශාල ප්‍රදේශයක් පුරා ගණින්නාන්සේලාගේ ව්‍යාප්තියක් දක්නට ලැබුණු බවයි.

නූතන ඉතිහාස කතිකාව තුළ ඇතැම් ඉතිහාසඥයින් ගණින්නාන්සේලා සම්බන්ධයෙන් සිදු කරන විවේචනවලදී කරන ප්‍රධාන චෝදනාව වන්නේ වෙහෙර විහාර සන්තක දේපල අතිසි ලෙස පරිහරණය කළ බවයි. ***සඟරජවත*** කතුවරයා පෙන්වා දෙන්නේ ඔවුන් විහාර දේපලවලින් අඹුදරුවන් පෝෂණය කරමින් කාමභෝගී

ජීවිත ගතකළ දුශ්ශීල පිරිසක් බවකි.[14] නමුත් මේ වන විට පිණ්ඩපාතිකව දානය ලබා ගැනීමේ ක්‍රමය අභාවයට ගොස් තිබූ අතර මොවුහු පන්සල අසල පිහිටි නිවසේ ආහාර පිසගෙන අඹුදරුවන් සමඟ එකට ජීවත් වූහ. දුරබැහැර ස්ථානවල ලැබුණු එම දානය සිය ඥාතීන් සමඟ බෙදාගෙන පරිභෝජනය කර ඇත.[15] පන්සල් සතු දේපල ආරක්ෂා කිරිම සඳහා අවශ්‍ය පසුබිම ගණින්නාන්සේ විසින් අනුගමනය කරන ලදි. විශේෂයෙන් ම ඉඩම් කිසිදු අවස්ථාවක පිටස්තර අයෙකුට හිමිවීමට ඉඩ නොතැබූ අතර ඔවුන්ගෙන් පසු දරුවන්ට පවරා දුන් බව පෙනේ. යම් හෙයකින් දරුවන් නොමැති වූ විට තම ඥාතිවරයෙකු පැවිදි කර එම ඉඩම් පවරා දීමට ක්‍රියාකර තිබේ. ඥාති ශිෂ්‍ය ක්‍රමය පසු කාලයේ සඟ සසුන වෙත බලපෑවේ ද මෙම යුගය ආරම්භ වීමේ ප්‍රතිඵලයක් ලෙස ය. යම් අයෙකු උපැවිදි වන්නේ නම් ඔහු තම ඥාතිවරයෙකු මහණ කර දේපල පවරා දුන් බවට ***කඩදොර සීට්ටුවේ*** සඳහන් වේ.

මෙම ක්‍රියාවලිය දුෂ්ප්‍රතිපත්තියක් ලෙස හුවා දැක්වුවත් සමකාලීනව පැවති වාතාවරණය තුළ එවැනි දෙයක් කිරිම අත්‍යවශ්‍ය වන්නට ඇත. විහාර සතු දේපල ආරක්ෂා කරගැනීමත් විහාරාරාම, පොත්පත් හා කලා ශිල්ප රැකගැනීමත් වැදගත් සේවාවකි. එදා ඔවුන් මුහුණපෑ උවදුරු මැද හෝ ආගමික සිද්ධස්ථාන ආරක්ෂා කිරීම වැදගත් ක්‍රියාවකි. දෙගල්දොරුව, රිදී විහාරය, දඹුල්ල වැනි ස්ථානයන්හි විසිතුරු චිත්‍ර, පෙති පිළිම නෙළීම, කැටයම් ආදී හෙළ කලා අදටත් ඉතුරුව ඇත්තේ ඔවුන්ගේ උනන්දුව නිසා විය හැකිය.

බුදු සසුනට යක්ෂ, භූත ශාන්ති කර්ම මෙම යුගයේ ඇතුළු වූ බව ඇතැම් අය නගන චෝදනාවකි. මෙකල බුදුදහම අමුතු කාලයේ ප්‍රතිපත්තිවලින් යුක්ත විය. සසුනේ පසුබෑම මධ්‍යයේ වුවද ගණින්නාන්සේ කටයුතු කර ඇත්තේ විශ්වාසවලට සහ ප්‍රතිපත්තිවලට මුල්තැන ලබා දෙමිනි. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුහු ද අනුක්‍රමයෙන් යකැදුරුකම්, බලිතොවිල් නැකැත් කීම්, යන්ත්‍ර මන්ත්‍ර

ජප කිරීම් ආදියෙහි නිරත වූහ. මෙම ක්‍රියාවලිය *සඟරාජවතෙහි* පහත සඳහන් ආකාරයට සඳහන් කර ඇත.

"දහම් ලෙස නොහැසිර - කුල දූසණම කර කර
බණ නොඋගෙන පවර - නැකැත් වෙදකම් පුරුදු කර
එයින් ලොව සිත් ගෙන - වස්තුව උපදවා ගෙන
අඹුදරුවන් රකින - පමණමයි උන් පුරන සිල්ගුණ" [16]

මෙම සිදුවීම් තුළින් සසුනේ පරිහානිය හැඟවෙතත් ශිව, හින්දු ආගම්වලින් බෞද්ධාගමට එල්ල වූ තර්ජනයන් වළකා ගැනීමට ගණින්නාන්සේලාට හැකි විය. ප්‍රස්තුත කාලපරිච්ඡේදයෙහි භික්ෂූන් වහන්සේලා හැඳින්වීම සඳහා භාවිත වූ සාම්ප්‍රදායික නම් මේ කාලයේ වෙනස් වී ඒ සඳහා විශේෂිත නාම භාවිත කර ඇත. යම් ගිහියෙකු පැවිදි වන විට ඔහුගේ ගිහි නම අතහැර සාම්ප්‍රදායික පැවිදි නමක් දීමත්, ගිහි වාසගම වෙනුවට පැවිද්දේදී උපන් ගම යෙදීමත් සාමාන්‍ය සම්ප්‍රදාය වේ. නමුත් මෙම යුගයේ තත්ත්වය වෙනස් වූ බව පෙනේ. බුද්ධරක්ඛිත නවරත්න ගණින්නාන්සේ, සුමංගල ඒකනායක ගණින්, වෙහැල්ලේ ගණවොලින්, ලබුතල ගණින්, වෙලාගේ ගණින් යන එබඳු සංඥා නාම කිහිපයකි.[17] මෙම නම්වල ස්වරූපය අනුව අවබෝධ වන්නේ ගණින්නාන්සේ හැඳින්වීමට පොදුවේ පිළිගත් සම්මත ක්‍රමයක් යොදා නොගත් බවයි.

තෙවලා දහම නොදත් ගණින්නාන්සේ ජනතාව අතරට ගියේ ශබ්ද මධුර්ය අවියක් ලෙස භාවිත කරමිණි. එක් අයෙකු මිහිරි හඬින් ජාතක කථා කියන විට අනෙකා උඩැක්කිය ගසන සිරිතක් ද විය. විශේෂයෙන් ම ඔවුන් බණ කීමට වෙස්සන්තර ජාතක කථාව හෝ වෙනත් ජාතක කථා භාවිත කළ බව පෙනේ. මෙසේ එළිවෙනතුරු ආසන දෙකේ බණ කීමේ ක්‍රමයක් ද තිබුණ බව පෙනේ. විහාර අස්න, දොරකඩ අස්න වැනි වෘත්තගන්ධි ශෛලියේ චූර්ණිකා ක්‍රමය ද කල එළිබැස්සේ ඔවුන්ගේ ධර්මදේශනා ක්‍රමය අනුවයි. මේ තුළින් අවබෝධ වන්නේ ගණින්නාන්සේලාට ඉහළ ශාස්ත්‍රීය ඥානයක් පැවති බවයි.

යම් අයෙකු පරලොව ගිය විට ගණින්නාන්සේලා අනුගමනය කළ ප්‍රතිපත්තිය ඉතා වැදගත් වේ. විශේෂයෙන් ම මතක බණවලදී මළගිය අයගේ ප්‍රාණකාරය සඳහා වෙස්සන්තර හෝ වෙනත් ජාතක කථාවලින් බණ දේශනා කර පින් පමුණුවා ඇත. මළගිය තැනැත්තාගේ නිවසේ නතර වී දේහය තබා ඇති ඇදෙහි සැතපෙමින් මළගිය අය සමඟ කථා කිරීම ද කර තිබේ. මළගිය අය වෙනුවෙන් ප්‍රේත පූජා පැවැත්වීම ද ගණින්නාන්සේලාගෙන් ආරම්භ වූවක් බව පෙනේ. ඒ සඳහා විශේෂයෙන් පිළියෙළ කළ ප්‍රේත තටුව සකසා තබන්නේ ඔවුන් විසින් ය. මෙම ක්‍රියාවලිය සමාජය තුළ වඩාත් ජනප්‍රියවීමත් සමඟ ම යක්ෂ ඇදහිලි වඩාත් ජනතාව අතර ප්‍රචලිතව පැවති බවට ගොන්සල්වේස් පියතුමාගේ පහත ප්‍රකාශනයෙන් අණාවරණය වේ. "තවද මෙබඳු අනදරවල් දැන දැන එබඳු අයට සිල්දෙන ගණිල්ලෝ ඒ පාපයෙන් රැකෙන්නෝ ය. ඒ නිසා මෙම රටේ බුදුන්ගේ නම මිසක් ආගම පැවතීමේ සිරිතත් නැතිව බුදුන්ට මල් පමණක් දී යකුන්ට ගස් ගෙඩි ආදි සියලු ම වස්තුව තහනම් කර දෙන හෙයින් භික්ෂු ඇදහිල්ල විනා බුදුන්ගේ ඇදහිල්ලේ කිසිවක් නැති බව සත්තකයි"[18] මෙම ප්‍රකාශය තුළින් පැහැදිලි වන්නේ ගොන්සාල්වේස් බුද්ධ ධර්මය කුමක්දැයි දැන සිටි බවත් එය නොපිළිපදිමින් යකුන් ඇදහීමේ යෙදී සිටි ගණින්නාන්සේට ඔහු විසින් අවඥා කරන ලද බවත් ය.

මහින්දාගමනයෙන් පසු මෙරට ඇති වූ බෞද්ධාගමික පුනර්ජීනයත් සමඟ රජය, සමාජය සහ භික්ෂූන් වහන්සේ අතර සබඳතාව ඉතා වැදගත් විය. බෞද්ධ සමාජය තුළ භික්ෂුව ඉටු කළ මෙහෙවර ප්‍රසංසනීය වේ. ගිහියන්ගේ මෙලොව ජීවිතය මෙන්ම ලෞකික ජිවිතයේ අභිවෘද්ධියට දැක් වූ අනුග්‍රහය ඉතා වැදගත් විය. කාලය ක්‍රමයෙන් ගතවීමේදී මෙරට සමාජයේ ඇති වූ දේශපාලන වෙනස්වීම් පදනම් කරගෙන සංඝ සමාජය තුළ ද යම් වෙනස්වීම් හටගත්තේ ය. පෘතුගීසින්ගේ ආගමනයත් සමඟ බටහිර ජාතීන්ගේ

බලපෑම සෘජු වශයෙන් සමාජ, දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්වීම් සමඟ භික්ෂු සමාජය කෙරෙහි ද බලපෑම් තදින් එල්ල විය. පිරිහෙමින් පැවති ආගම, ධර්මය, සාරධර්ම සහ චාරිත්‍ර ආරක්ෂා කිරීම උදෙසා ක්‍රියාශීලී යුග මෙහෙවරක් ඉටු කළ පිරිසක් ලෙස ගණින්නාන්සේලා හැඳින්විය හැකිය.

පෘතුගීසින්ගේ වාණිජ අරමුණු සහ ආගමික අපේක්ෂා සපුරා ගැනීමට යාමත් සමඟ බුදු සසුනෙහි ප්‍රබෝධය ගිලිහෙන ලදි. ඊට අමතරව රාජාරක්ෂාව නැතිවීම, ක්‍රිස්තියානි බලපෑම, දේශපාලන වෙනස්කම්, හින්දු ආගමේ ව්‍යාප්තිය, කුල භේදය සහ ඥාති ශිෂ්‍ය ක්‍රමය වැනි හේතු ද බුදුසසුනේ පරිහානියට සෘජු වශයෙන් හේතු වූ බව පෙනේ.[19] ප්‍රධාන අගනගරය වූ කෝට්ටේ රාජධානිය ධර්මපාල විසින් පෘතුගීසින්ට පැවරීමෙන් පසු සංඝ ශාසනයේ අවනතිය වේගවත් විය. ශිව ආගම වැළඳගත් රාජසිංහගේ ක්‍රියා කලාපය තුළින් ශාසනික බිඳවැටීම වඩාත් වේගවත් වූ බව පෙනේ. සීතාවක රාජසිංහගේ මරණයෙන් පසු සමස්ත වෙරළබඩ තීරයේම බලය පෘතුගීසින් මත තහවුරු විය. 15 වැනි සියවස අවසානයේ පාප් වහන්සේගෙන් ලැබුණු ප්‍රඥප්තිය මඟින් ආසියාතික හා අප්‍රිකා රාජ්‍යවල කතෝලික ආගම ව්‍යාප්ත කිරීමට හිමි වූ බලය දෙවියන් වහන්සේ වෙනුවෙන් සිය යුතුකම් ඉටුකිරීමක් සේ සලකා පෘතුගීසි අධිරාජ්‍යයා ක්‍රියා කළේය.[20] මිෂනාරින්ගේ බලපෑම මත පෘතුගීසි සොල්දාදුවෝ මුන්නේශ්වරම් සිට දෙවුන්දර තුඩුව දක්වා බෞද්ධ හා හින්දු ආගමික මධ්‍යස්ථාන විනාශ කර දැමූහ. මෙම තත්ත්වය බෞද්ධාගමේ පරිහානියට ද සෘජුව බලපෑවේ ය.

අසරණභාවයට පත් වූ බෞද්ධ ජනතාවට සහ භික්ෂූන් වහන්සේලාට සීතාවක රාජධානියේ ද රැකවරණය නොලැබුණි. විශේෂයෙන් ම සිංහල රාජධානි නිරිතදිගට සංක්‍රමණය වීමෙන් පසු පෙර අවධියට වඩා දේවාගම ඇදහීම කෙරෙහි විශාල වශයෙන්

නැඹුරුවීමක් දක්නට ලැබුණි. සීතාවක රාජධානියෙන් හින්දු ආගමට සෘජු අනුග්‍රහය ලැබීම නිසා වෙරළබඩ තිරයට සාපේක්ෂව උඩරට පළාත්වල හින්දු ඇදහිල්ල ජනප්‍රිය වූ බව පෙනේ. ප්‍රධාන වශයෙන් අයියනායක, පත්තිනි, නාථ, උපුල්වන්, දැඩිමුණ්ඩ, විභීෂණ යන දෙවිවරුන් ද කඩවර වැනි යක්ෂයෝ ද මේ අතර වූහ. මෙම අවධියේ උඩරට පළාත් කේන්ද්‍රගතව ඉදි වූ විහාරයට සම්බන්ධව දෙවියන් සඳහා දෙවොලක් ඉදිවීම අනිවාර්ය අංගයක් බවට පත්වීය.

දාසය වැනි සියවසට පසු පාලනයට පත් උඩරට සිංහල රජුන්ට රාජ්‍යය රැකගැනීම සඳහා මාරාන්තික සටන්වල යෙදීමට සිදු වූ නිසා බුදු සසුන හා සඟ පරපුර ගැන අවධානය යොමු කිරීමට ඉඩක් නොවූ අතර, ඔවුනට ඒවා ගැන තිබූ අවබෝධය ද මඳ විය.[21] විශේෂයෙන් බෞද්ධාගමේ අභිවෘද්ධිය ඇති කිරීම සඳහා උඩරට රජතුමා පියවර කිහිපයක් ම ගැනීමට කටයුතු කළේය. ලංකා රාජ්‍යයේ රාජ්‍ය උරුමය වශයෙන් පිළිගැණුන දළදා වහන්සේ දෙල්ගමු විහාරයෙන් සෙංකඩගල විහාරයට වැඩම කළ පළමු වන විමලධර්මසූරිය රජතුමා (ක්‍රි.ව.1592- 1604) රජමැදුර ආසන්නයේ දළදා මැදුරක් ඉදිකොට නිරන්තර පුද පූජා පැවත්වීය. බලයට පත්වීමෙන් අනතුරුව දෙවනගල හිමියන්ට විහාර ගම්වර පූජා කළ බවට දෙවනගල සන්නසෙහි සඳහන් වේ. ගිහි පැවිදි බලවේග නිසා සසුනේ දියුණුවට කටයුතු කිරීමට රජු පෙළඹුණමුත්, බුදු දහම සහ සංඝයා ගැන පැවති අඩු දැනුම නිසා, එහි පැවැත්ම හා දියුණුව සඳහා යමක් කිරීමට අපොහොසත් වූ බව පෙනේ.[22] මේ නිසා භික්ෂූන් වහන්සේලාගේ තත්ත්වය ඉතා කණගාටුදායක ලෙස පිරිහිණ. උපසම්පදාව ලත් භික්ෂූන් වහන්සේලා සංඛ්‍යාව ශීඝ්‍රයෙන් පහළ බැස්සේ ය. ක්‍රි.ව.1597 වනවිට උපසම්පදාව අවශ්‍ය වූ භික්ෂූන් වහන්සේලා 20 නමක්වත් ලංකාව තුළින් සොයාගැනීමට නොහැකි වූ බැවින් රක්ඛංගදේශයට දූත පිරිස් යවා නන්දිචක්ක හා චන්දවිශාල යන භික්ෂූන් වහන්සේලා දෙනම ඇතුළු අතිරේක භික්ෂූන් වහන්සේලා එම වසරේදී ගැටබේකොටේදී උපසම්පදා කර්මය

පැවැත්විය.[23] මේ අනුව පරිහානියට පත්වෙමින් පැවති භික්ෂු සංස්ථාව තාවකාලිකව නගා සිටුවීමට හැකි වූ බව පෙනේ.

සීතාවක රාජධානියේ අනුග්‍රහය යටතේ ව්‍යාප්ත වූ හින්දු ආගමේ බලපෑම කන්ද උඩරට ප්‍රදේශය කරා ද බලපෑවේ ය. හින්දු පූජකවරුන් බුදුදහම විනාශ කිරීමට විශාල වශයෙන් ක්‍රියාමාර්ග ගත් අතර විශේෂයෙන් ගිරි නම් ශිව පූජකවරයා උඩරට රජුට එරෙහිව කැරැල්ලක් ද ඇති කළ බවට පෙනේ. කැරැල්ල මර්දනය කළ රජු පහතරට ප්‍රදේශයේ බෞද්ධයන්ට පෘතුගීසීන්ගෙන් සිදුවූ හිරිහැර වැළැක්වීමට ද ආධාර ලබා දුන්නේය. මෙම රජුගෙන් පසු කලක් පැවිදිව සිට උපැවිදි වූ සෙනරත් රජු (ක්‍රි.ව.1604-1635) බලයට පත්වුවත් දුර්වලවී ගිය උඩරට සංඝ සංවිධානය ක්‍රමවත් තත්ත්වයකට ගෙන ඒමට නොහැකි විය. ඔහු පුත් දෙවන රාජසිංහ (ක්‍රි.ව.1635-1687) නිරන්තරයෙන් පෘතුගීසීන් පන්නා දැමීමට සංග්‍රාමයක නිරත විය. මේ නිසා සංඝ සංවිධානය ක්‍රමවත් සේ පවත්වා ගෙන යාමට අවශ්‍ය රාජකීය අනුග්‍රහය ලබාදීමට ඔහුට ද නොහැකි වූ බව පෙනේ. විශේෂයෙන් දෙවන විමලධර්මසූරිය (ක්‍රි.ව.1687 -1707) රජු බලයට පත් වූ අවධිය වන විට උපසම්පන්න භික්ෂූන් වහන්සේ කෙනෙකු නොසිටියේ ය. ශාසනික වත්පිළිවෙත් දැන සිටි පිරිස ද විරල වූහ. භික්ෂූන් අතර ශිෂ්‍යානුශිෂ්‍ය පරම්පරාව වෙනුවට දේපල හිමිකම් හා බැඳුණු වර්ග පරම්පරා හා සිවුරු පරම්පරා ක්‍රමය වර්ධනය විය. ඉපැරණි අධ්‍යාපන ක්‍රමය ද විනාශයට පත්විය. මෙම රාජ්‍ය සමයේ උඩරට ක්‍රියාත්මක වූ රෝමානු කතෝලික ව්‍යාපාරයට එරෙහිව මහජනතාව නැගී සිටි විට රජතුමා නිහඬව සිටියේය.[24] නැවත වතාවක් මේ අවධියේ සසුනේ අභිවෘද්ධිය වෙනුවෙන් උපසම්පදා විනය කර්මයක් ක්‍රි.ව. 1697 දී ගැටඹේ තොටේදී පවත්වන ලදී. මෙහි මූලිකත්වය ලෝකරාග සහ සන්තාන යන මහා තෙරවරුන් විසින් ඉසිලී ය. මෙම උපසම්පදාව පැවැත්වීම සසුනේ ඉදිරිපැවැත්මට බෙහෙවින් උපකාරී වූ බව පෙනේ. මින් පසු වාර්ෂික උපසම්පදා

උත්සවය පවත්වා භික්ෂු ශාසනය නොකඩවා පවත්වාගෙන යෑම රජුගේ වගකීමක් සේ සලකා කටයුතු කරන ලදි.[25]

නාම මාත්‍රයෙන් පමණක් බුදුදහම ඇදහූ විනෝදකාමියෙකු වූ ශ්‍රී වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු (ක්‍රි:ව: 1707-1739) භක්තිවාදයට පමණක් යට වූ, ඥානවාදය ගැන කිසිදු හසරක් නොදත් අයෙකු සේ ක්‍රියා කිරීම නිසා සඟ පරපුරේ හෝ භික්ෂු ආයතනයන්ගේ කිසිත් පුනරුද්දීප්තියක් ඇති නොවිණ.[26] මෙම රජු බලයට පත් වී අවුරුදු කිහිපයක් ගත වූ පසු භික්ෂු ශාසනයේ පිරිහීමක් දක්නට ලැබුණි.[27] පෘතුගීසි මූලාශ්‍රවලට අනුව තහවුරුවන්නේ ජාකොමේ ගොන්සාල්වේස් හා ඉග්නේෂස් ද අල්මේදා යන කතෝලික පියවරුන් දෙදෙනා ද නරේන්ද්‍රසිංහ රජුගේ සහය ඇතිව මිෂනාරි කටයුතුවල නිරත වූ බව පෙනේ. රජතුමා පෘතුගීසීන් පලවාහැරීමට ලන්දේසීන්ගෙන් සහය ලබාගන්නා ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලන්දේසීන්ට රෙපරමාදු කතෝලික ධර්මය ද ව්‍යාප්ත කිරීමට ද හැකි විය. මුල් ජාතියට වඩා උපක්‍රමශීලී වූ සිංහල රජුන් හා නායකයින් චාටුවෙන් රවටා තෑගි බෝග පිරිනමා සිංහල ප්‍රදේශවල ආගම ව්‍යාප්ත කිරීමට පටන් ගත්තේය. රටේ සාරය සහමුලින් ම කොල්ලකා සමහර ප්‍රභූ තත්ත්වයේ සිටි භික්ෂූන් සිවුරු අරවා බෞතීස්ම කොට තම ආගමට හැරවීමටත්, සමහර භික්ෂූන් වස දී මැරවීමටත් කතෝලික පූජකයන් ක්‍රියා කර ඇත.[28] විධිමත් අධ්‍යාපන ක්‍රමයක් ගොඩනැගූ ලන්දේසීන් එමඟින් ජනතාව ක්‍රිස්තියානියට හැරවිය. මෙම තත්ත්වය යටතේ මහ සඟන ද පිළිවෙත් හා උගත්කමින් පිරිහී ප්‍රපාතයට ඇද වැටිණි.

අප මෙතෙක් සාකච්ඡා කළ තොරතුරුවලින් පැහැදිලි වන්නේ බෞද්ධාගම විවිධ බාහිර සහ අභ්‍යන්තරික බලපෑම් හමුවේ පරිහානිය සිදු වූ බවයි. විවිධ තාඩන පීඩන එල්ලවීමත් සමඟ භික්ෂූන් වහන්සේලා සාසනික කටයුතුවලින් ඉවත් වූ බව පෙනේ. අනාදිමත් කාලයක සිට ග්‍රන්ථධූර, විදර්ශනාධූර, ග්‍රාමවාසී, ආරණ්‍යවාසී යන

විවිධ කොටස් විසින් ආරක්ෂා කළ, භික්ෂූන් වහන්සේලාට කැප වූ ජීවන ක්‍රමය එමඟින් අභාවයට ගිය අතර, භික්ෂු සාසනය ද, ශීඝ්‍රයෙන් පිරිහිමට පත් වූ බව පෙනේ.

ඉහත තොරතුරු තුළින් අනාවරණ වන්නේ බටහිර ජාතින් විසින් මෙරට අනුගමනය කළ දැඩි නීතිරීති හමුවේ බෞද්ධාගමට අත් වූයේ මහත් අභාග්‍ය සම්පන්න ඉරණමකි. එවන් පසුබිමක බෞද්ධාගමේ වත්පිළිවෙත් ආරක්ෂා කරමින් කටයුතු කරනු ලැබුවේ ගණින්නාන්සේ ය. උඩරට සහ පහතරට ප්‍රදේශවල සසුනේ අභිවර්ධනයට විශාල නිහඬ සේවයක් ඔවුන්ගෙන් සිදු වූ බව පෙනේ. ශාසනයට එබඳු සේවයක් කළ ගණින්නාන්සේ පිළිබඳව තොරතුරු හෙළිවන්නේ ඉතාමත් සුළු වශයෙනි.

සිවුර දරමින් ආගමික කාර්යවල නිරතවීමට ගණින්නාන්සේලාට නොහැකි වූයේ පැවති වතාවරණය තුළ තිබු අභියෝග නිසා විය හැකිය. එබැවින් අවස්ථානුකූලව සුදුරෙදි ඇඳ හෝ කහ තුලක් අතේ දරමින් ආගමික වත් පිළිවෙත් දැරිම ප්‍රසංසනීය වේ. මුහුදුබඩ පළාත් ලන්දේසීන්ට යටත්ව පැවති කාලයේ ඔවුන්ගේ බල ප්‍රදේශය තුළ අන්‍ය ආගම් ඇදහිලි හා ප්‍රචාරය කිරිම නීතිය මගින් ම තහනම් කර තිබිණ.[29] ඔවුනට විශේෂයෙන් ම ආරක්ෂා වීමට සිදුවූයේ ලන්දේසි නිලධාරීන්, පූජකයන් හා නිලධාරීන්ට හිත්වත්කම් දැක්වූ මුලාදැනීන්ගෙනි.[30] එවන් පසුබිමක් තුළ පසු කාලයේදී උඩරට රජතුමාගේ සහයෝගය ද හිමිවීම ඉතා වැදගත් අවස්ථාවකි. බුද්ධ ශාසනයේ පැවැත්ම පිළිබඳ දරුණු අර්බුදයක් පැන නැගී පැවති අවස්ථාවක තම වගකීම මනා ලෙස අවබෝධ කරගත් ගණින්නාන්සේ ආගමික සිද්ධස්ථාන සහ ධර්ම ග්‍රන්ථ ආරක්ෂා කරගැනීම සඳහා කැපවී සේවය කර ඇත.

ලන්දේසීන් දහඅට වැනි සියවසේ ක්‍රියාත්මක කළ දරදඬු නීතිරීති හමුවේ ගණින්නාන්සේලා ස්වකීය ආරක්ෂාව සලසාගනු

ලැබුවේ ලන්දේසි ආධිපත්‍යයෙන් තොර ප්‍රදේශවල ය. මහාචාර්ය එම්.යූ.ද සිල්වා පෙන්වාදෙන ආකාරයට මුල්කිරිගල, කතරගම, තිස්සමහාරාමය, බඳගිරිය, තොටවාය, කහගල, අමංගල, කහදාව, වේහැල්ල, කහමෝදර, පඬුමුල්දෙණිය, ගලටුව වැනි ආරක්ෂා සහිත් වූත් පහසුවෙන් පුනරුත්ථාපනය කළ හැකි වූත් පෞරාණික වෙහෙර ආශ්‍රිතව ඔවුන් තම කටයුතු පවත්වාගෙන ගිය බව පෙනේ.[31] එපමණක් නොව දෙනගම, දෙයියන්දර, හාතාගල, ඌරාපොල, ගොඩපිටිය, රන්සෑගොඩ, හිත්තැටිය, වෙහෙරගම්පිට, පලාබත්ගල, ගිලීමලේ, ඇඹිලිපිටිය, කුරුවිට, නිවිතිගල, රත්නපුර, බලංගොඩ, පනාවැන්න, තොටගමුව, අනුරාධපුරය, රුවන්වැලිසෑය, මිහින්තලේ යනාදී විහාරස්ථාන ආශ්‍රිතව ද ගණින්නාන්සේලා වාසය කළ බවට හේන්පිටගෙදර පියනන්ද හිමියන් විසින් පෙන්වා දෙනු ලැබෙයි.[32] ඔවුන් මෙම විහාරස්ථාන කේන්ද්‍රගතව සිටීම තුළින් එහි ආරක්ෂාව මෙන්ම බෞද්ධ අනන්‍යතාව ද රැකිනි. ගණින්නාන්සේ බෞද්ධ ජනතාව හා නිරන්තර සම්බන්ධතා පවත්වමින් පෙර රජ දවස මෙන් විශාල යුග මෙහෙවරක නිරත විය. උපතේ සිට මරණය දක්වා සිදු කරනු ලබන සෑම කටයුත්තක් ම මහත් ඕනෑකමින් හා වගකීමෙන් නොපිරිහෙළා ඉටු කළ බවට කොටගම වාචිස්සර හිමි ***සරණංකර සංඝරාජ සමය*** මඟින් පෙන්වාදීමට සමත්ව ඇත.[33]

ශාසනය රැකෙන්නේ තමන් ආරක්ෂාවීමෙන් බව අවබෝධකරගත් ගණින්නාන්සේලා හැකි සෑම අවස්ථාකවදී ම මනා අවබෝධයෙන් කටයුතු කළ බව පෙනේ. බොහෝවිට දසසිල් සමාදන් වී තම සහෝදරයෙකුගේ හෝ වෙනත් ඥාතියෙකුගේ නිවසෙහි නතරවී ආගමික කටයුතුවල නිරතව ඇත. ගණින්නාන්සේ බොහෝවිට ස්වකීය වාසස්ථානය සඳහා තෝරාගත්තේ විහාරය ආසන්නව පිහිටි ස්ථානයකි. ශාසනයේ අනාගත අභිවෘද්ධිය ප්‍රාර්ථනා කළ ගණින්නාන්සේ ඒ සඳහා වඩා ශක්තිමත් ගෝල පිරිසක් ද සැකසීමට පියවර ගත්හ. පැවැති දුෂ්කර අවස්ථාවේ පැවිදි බිමට

ඇතුළත් වූ තරුණයින් වැඩිදෙනෙකු වෙදමහත්වරුන්ගේ පරම්පරාවලින් පැවත එන අය බව පෙනේ. තැනින් තැන ගමන් කරමින් කටයුතු කළ ඔවුන් එකම ස්ථානයක රැඳී සිටියේ වස්කාලයේ පමණි.[34] මෙම කාල සීමාව තුළ උපසම්පදාව පැවැත්වීමට භික්ෂූන් වහන්සේලා නොවූ හෙයින් උපසම්පදාව නොලැබ ක්‍රියා කිරීමට ගණින්නාන්සේලාට සිදුවිය. ඔවුන් පාරිශුද්ධ ජීවිත ගතකරමින් විහාර, චෛත්‍ය ආරක්ෂා කළා පමණක් නොව එතෙක් ශේෂව පැවති භාෂා ඥාණය පිළිබඳ දැනුම ගෝලයන්ට ලබාදීමට ද ධර්ම ග්‍රන්ථ සුරක්ෂිතව පවත්වාගෙන යාමට ද පියවර ගන්නා ලදි. ගණින්නාන්සේ ගැමි දරුවන්ගේ අධ්‍යාපනික හා සදාචාරාත්මක ගුණ ධර්ම වර්ධනය කිරීමට ද සමත් වූ පිරිසකි. ගණින්නාන්සේ රාජකීය සන්නස්වල ගණවොලින් නමින් ද ඕලන්ද ලේඛනවල සිල්වතා ලෙඝ ද හඳුන්වා ඇත.[35]

ඔවුහු පොත පත ලියමින් පැරණි පොත් පත් විනාශ වීමට ඉඩනොදී ආරක්ෂා කළහ. බුදුදහමේ අන්තර්ගත ත්‍රිපිටකය වැනි ගැඹුරු ධර්ම කරුණු අඩංගු පොත්පත් නොලියූ අතර එදිනෙදා නිතර අවශ්‍ය වන *පූජාවලිය* වැනි සිංහල බණපොත් ලියා ඇත.[36] යම් ග්‍රන්ථයක් රචනා කර එහි ඇති ආනිසංස ජනතාව වෙත එත්තුගැන්වීමට පහත ආකාරයේ පාඨයක් යොදා ඇති බව කොටගම වාචිස්සර හිමියෝ පෙන්වා දෙති. එනම්,

" ලිඛාය පාළිතො ධම්මං
නවකොටි සහස්සතං
කප්පං අක්ඛර ගණනාය
චක්කවත්ති භවිස්සති"[37]

එමෙන්ම අනාදිමත් කාලයක සිට රජදරුවන් සහ ප්‍රභූන් විසින් විහාරවලට පූජාකරන ලද ඉඩකඩම්, පෙති පිළිම යනාදිය ආරක්ෂා කිරීමේ කටයුතුවල නිරත වූයේ ගණින්නාන්සේලා ය. ස්වකීය ඥාතින් විහාර ආසන්නයේ පදිංචි කරමින් එම දේපල

රැකීමට කළ මෙහෙවර ඉතා ප්‍රසංසනීය වේ. කොටගම වාචිස්සර හිමියන් සඳහන් කරන ආකාරයට දෛනිකව සිදු කරන බුද්ධ පූජාව වෙනත් කිසිදු කෙනෙකුට නොදී ගණින්නාන්සේ විසින්ම ඉටු කළ බව පෙනේ. ගණින්නාන්සේ වාසය කළ විහාරය ආශ්‍රිතව ජීවත් වූ ගැමිදරුවන්ට බණ දහම් උගන්වන අතර වෙදකම, නැකැත්කීම, යන්ත්‍ර මන්ත්‍ර හා ගුරුකම් උගන්වා ඇත. බෞද්ධාගම හා සම්බන්ධව පැවති භාෂා සාහිත්‍යය සහ සංස්කෘතික අනන්‍යතාවය ආරක්ෂා කර ගැනීම සඳහා වූ ප්‍රබල බලවේගයක් ගණින්නාන්සේලා තුළින් ක්‍රියාත්මක වූ බවත් ඊට උඩරට රාජධානියෙන් ලැබුණු ආධාර නිසා ශාසනික කටයුතු වඩාත් පහසු වූ බවත් පෙනේ.

මාතර, හම්බන්තොට ආදි ප්‍රදේශවල බෞද්ධාගමික කටයුතුවල යෙදුණු ගණින්නාන්සේලා උඩරට රජතුමාත් සමඟ ද නිරන්තර සබඳතා පැවැත්වූහ. රාජ්‍ය ආරක්ෂාව සහ රාජ්‍ය අනුග්‍රහය ලබමින් උඩරට පමණක් සීමාවී ආගමික කටයුතුවල නිරතවීමට ගණින්නාන්සේට හැකියාව තිබුණ ද එවන් දෙයක් කළේ නැත. ලන්දේසි බලපෑම තුළ ජනතා සහයෝගය ලබාගැනීම දුෂ්කර කාර්යයක් විය. නමට පමණක් කතෝලිකයන් වූ ජනතාව රහසිගතව ගණින්නාන්සේලාගේ කටයුතුවලට සහයෝගය ලබාදීමට ක්‍රියා කළ බව පෙනේ. ගණින්නාන්සේලාගේ සේවය පිළිබඳව මහා අවධියෙන් සිටි ලන්දේසිහු ඔවුන් ඒකරාශි වන ස්ථාන හඳුනාගෙන ඒවා විනාශ කිරීමට පියවර ගත්හ.[38] එම කටයුතු තුළින් ගණින්නාන්සේගේ ක්‍රියාකාරිත්වය අඩපණ කිරීමට නොහැකි වූ අතර ඔවුහු උඩරට හා පහතරට පළාත් දෙකේ ම ආගමික මෙහෙවර වඩාත් සාර්ථකව ඉටු කළහ.

දෙවන රාජසිංහ රජතුමා මුහුදුබඩ ප්‍රදේශ ජන ශූන්‍ය කිරීම හා ෆන් හූන්ස් ලන්දේසි ආණ්ඩුකාරවරයාගේ දැඩි පාලන ප්‍රතිපත්ති නිසා ගණින්නාන්සේලාට ද අපහසු කාලයක් උදා විය. උඩරට සහ

ලන්දේසි අතර හිතවත්කම් දියුණුවීමත් සමඟ ගණින්නාන්සේගේ කටයුතු තව තවත් සාර්ථක වූ බව පෙනේ. උඩරට රජු පහතරට ප්‍රදේශයන්හි බෞද්ධයන්ට ආගමික නිදහස ලබාදෙන ලෙස ද ත්‍රිකුණාමලයේ සහ කැලණියේ ඇති බෞද්ධ සිද්ධස්ථාන පුනරුත්ථාපනය කිරීමට අවසර දෙන ලෙස ද ක්‍රි.ව. 1789 මාර්තු 12 වන දින නිකුත් කළ තල්පතකින් ඉල්ලා සිටියේ ය.[39] පෘතුගීසින් විනාශ කරන ලද කැලණි විහාරය ගණින්නාන්සේගේ කැපවීම නිසා යළි බෞද්ධයන්ට වැඳුම්පිදුම් කළ හැකි ස්ථානයක් බවට පත්විය. ක්‍රි.ව. 1688 බෞද්ධයින් විශාල වශයෙන් ඒකරාශිවී උත්සවයක් පැවැත්වීමත් සමඟ ඊට උරණ වූ ප්‍රෙඩිකන්ට්වරුන් බෞද්ධ බැතිමතුන්ට හිරිහැර කර තිබේ. ඉන් පසුබෑමට ලක් නොවූ ඔවුන් එම ස්ථානය ආරක්ෂා කිරීමට දිවිහිමියෙන් කටයුතු කර ඇත. අවසානයේ ඇතිවෙමින් පැවැති තත්ත්වය පිළිබඳ කරුණු විමර්ශනය කළ උඩරට රජතුමා පහතරට ප්‍රදේශයේ බෞද්ධයන්ට නිදහසේ කටයුතු කිරීමට අවසර ලබාදෙන ලෙස ලන්දේසීන්ගෙන් ඉල්ලීමක් කර ඇත. ස්වකීය වාණිජ අරමුණු ඉටුකර ගැනීමට තම රජු සමඟ ගැටලු ඇතිකරගෙන ඇතිවන තත්ත්වය තේරුම්ගත් ලන්දේසීන් අකැමැත්තෙන් වුවද රජුගෙන් අදහසට එකඟ වූ බව පෙනේ. එහි ප්‍රතිඵලයක් ලෙස ක්‍රි.ව. 1704 දී බෞද්ධයන්ට කැලණි විහාර භූමියේ අයිතිය පවරා දී ඇත.

මෙම අවධිය වනවිට ක්‍රිස්තියානියට විරුද්ධව ජනතාව එළිපිට ඉදිරිපත් වීමත්, උඩරට රජතුමා නිරන්තරයෙන් පහතරට බෞද්ධයන්ගේ ආගමික වත්පිළිවෙත් පවත්වාගෙන යාමට අනුග්‍රහය ලබාදීමත් නිසා ද බෞද්ධ වත්පිළිවෙත්වලට අවහිර නොකළ යුතු බවට ලන්දේසීන් අවබෝධ කර ගත්තා ලදී. ඒ සඳහා ඉවහල් වූයේ ගණින්නාන්සේලා කාලයක් තිස්සේ කැපවීමෙන් ක්‍රියාකාරීම නිසා උදා වූ මෙහෙවරයි. රජයේ ප්‍රතිපත්ති නිසා ඇති වූ ආගමික සහනශීලීතාව නිසා සැඟවී සිටි ප්‍රදේශවලින් ඉදිරියට පැමිණි ගණින්නාන්සේලා එළිමහනේ ආගමික කටයුතුවල නිරත වූහ. උඩරට

සහ පහතරට වශයෙන් කිසිදු භේදයක් නොමැතිව විවිධ ප්‍රදේශවල සැරිසරමින් ආගමික කටයුතුවල නිරතවීමට ඔවුන්ට හැකිවිය. විශේෂයෙන් ම නාමිකව පමණක් ක්‍රිස්තියානි භක්තිකයන් බවට පත්ව සිටි ජනතාව ඉදිරියට පැමිණ බෞද්ධ කටයුතුවලට සහයෝගය ලබා දී ඇත.[40]

දහඅට වැනි සියවසේ අවසාන භාගය වන විට ප්‍රබල තත්ත්වයකින් ක්‍රියාත්මක වූ භික්ෂූන් වහන්සේලා පරපුර කිහිපයක් ඉදිරියට ආවේය. ගණින්නාන්සේලා වශයෙන් සිට ඔවුන්ගේ මෙහෙවර අති විශිෂ්ට විය. සරණංකර හිමියන්ගේ ආගමික කටයුතුවලට ඉමහත් පිටුවහලක් වූ සිටිනාමළුවේ ධම්මජෝති සහ වෙහැල්ලේ ධම්මදින්න හිමියන් නිසා ආරම්භ වූ වෙහැල්ලේ පරම්පරාව ද වටරක්ගොඩ ධම්මපාල සහ බෝවල ධම්මානන්ද හිමියන් ප්‍රමුඛව ආරම්භ වූ මුල්කිරිගල පරම්පරාව ද මේ අතර ප්‍රමුඛ විය. පහතරට සියම් නිකායික භික්ෂු පරපුරේ ආරම්භකයා ලෙස සැලකෙන වෙහැල්ලේ ධම්මදින්න හිමියන් සහ ඔහුගේ ජ්‍යෙෂ්ඨ විහාරික සිටිනාමලුවේ ධම්මජෝති හිමියන්ගේ ආචාර්යවරයා වූයේ කහදූව විහාරයේ වැඩවුන් කදුරුපොකුණේ නවරත්න බුද්ධරක්ඛිත ගණින්නාන්සේ ය. වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගෙන් මේ හිමි නම ක්‍රි.ව.1725 දී මහා විහාරය ඇතුළු ගම්වරයන් ලබා ඇත.[41] දැනට හඳුනාගෙන තිබෙන තොරතුරුවලට අනුව මෙම හිමියන් දෙවන විමලධර්මසූරිය රාජ්‍ය සමයේ දී උපසම්පදාව ලබාගෙන තිබුණත් පැවති අනාරක්ෂිතභාවය නිසා සාමණේර හිමිනමක් ලෙස වාසය කර ඇත.[42]

අමරපුර නිකායේ ආරම්භක මුල්කිරිගල පරම්පරාවේ බෝවල හිමියන්ගේ ගුරුවරයා වූයේ නලගම මහිරතන හිමියන් ය. මෙතුමාගේ ගුරුවරායා වූ වටරක්ගොඩ ධර්මපාල වූ අතර ඔහුගේ ගුරුවරයා වූයේ කළුගල ගණින්නාන්සේ ය. සියම් උපසම්පදාව දකුණු පළාතේ ව්‍යාප්ත වූ පසු වෙහැල්ලේ සංඝ පරම්පරාව ද ඉතා වැදගත් විය. විශේෂයෙන් ම මෙහි නායකත්වයට පත් වූ වෙහැල්ලේ

ධම්මදින්න හිමියන් ප්‍රසිද්ධ ගණින්නාන්සේ කෙනෙකි. ඒ සමයෙහි එම හිමියන් හඳුන්වා ඇත්තේ වෙහැල්ලේ ධම්මදින්න ගණවොලින් ලෙස ය.[43] ක්‍රි.ව. 1725 වීරපරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා විසින් කඳුරු පොකුණේ බුද්ධරක්ඛිත ගණින්නාන්සේ වෙත යවන ලද සන්නසෙහි ගණින්නාන්සේ යනුවෙන් ද, නැවත එම රජු විසින් ම වෙහැල්ලේ ධම්මදින්න හිමියන් කතරගම විහාරය හෙළි පෙහෙළි කර සැදැහැවතුන්ගේ පුද පූජා සඳහා සුදුසු ආකාරයට පත් කළ නිසා ක්‍රි.ව. 1728 කතරගම විහාරය සහ ගණවොලින් යන උපාධි නාමය පරිනමා ඇත.[44]

මේ අනුව පැහැදිලි වන්නේ රජවාසල තුළ පවා ගණින්නාන්සේ යන ගෞරවනාමය පිළිගැනීමට ලක්ව තිබූ බවයි. වෙහැල්ලේ ධම්මදින්න හිමියන් ශාසනික වශයෙන් විශාල ප්‍රබෝධයක් ඇති කිරීමට සමත් වූහ. උන්වහන්සේ විශාල පිරිසක් සසුන්ගත කළ අතර බටහිර ජාතීන්ගේ ආක්‍රමණයෙන් විනාශයට පත්ව තිබූ පැල්මඩුල්ල, ගල්පොත්තාවෙල සහ පලාපත්ගල යන විහාරාස්ථාන ප්‍රතිසංස්කරණය කිරීමට ද පියවර ගෙන තිබේ. පහතරට ප්‍රදේශයේ ශාසනික ප්‍රබෝධය ඇති කිරීම පිණිස දායක වූ රන්සෑගොඩ ධම්මදින්න ගණවොලින්, වැව ඉන්ද්‍රසාර ගණින්නාන්සේ, වටරක්ගොඩ ධර්මපාල ගණින්නාන්සේ, ඉලිපැන්ගමුවේ හිමි සහ කදිරගොඩ හිමි යන අය ප්‍රමුඛයෝ වෙති.

උඩරට රජවරු නැතිවීගිය උපසම්පදාව යළි ස්ථාපිත කිරීම පිණිස රක්ඛංග දේශයෙන් දෙවරක් ම උපසම්පදාව ගෙන ඒමට ක්‍රියා කළහ. පළමු හා දෙවන විමලධර්මසූරිය රජවරුන් රාජ අනුග්‍රහය ලබාදී ඇත. එනමුත් එය එතරම් සාර්ථක නොවීය. මෙම අන්ධකාර ශාසනික විලෝපන කාලය අවසන් වන්නේ වැලිවිට සරණංකර හිමියන්ගේ පුනර්ජීවන ව්‍යාපාරයත් සමඟ ය. සිල්වත් සමාගම පුරෝගාමීව ඇරඹූ ක්‍රියාවලිය තුළින් මෙතෙක් නැති වී ගිය ධර්ම සහ

සංඝ සමාජය නැවත ගොඩනැඟීම සඳහා අවකාශ ඇති විය. ශ්‍රී ලංකාවේ චිරකාලීනව පැවත ආ ආරණ්‍යක සම්ප්‍රදාය සොයා ගිය අතීත සම්ප්‍රදායේ ජීව බලවේග ඒකරාශී කරන උත්සහායක් ලෙස උපසම්පදාව සැලකීමට හැකි වේ. මෙරට ශාසනයේ වර්ධනය මල් ඵල දැරුවේ ක්‍රි.ව.1753 දී ය.[45]

ගණින්නාන්සේලා තුළින් ඉටුවූ යුගමෙහෙවර නිසා සියම් උපසම්පදාවේදීත් උන්වහන්සේලා ඇගයීමට ලක්වීම කැපී පෙනේ. ක්‍රි.ව. 1753 ජුනි මස 22 වැනි දින මහනුවරට පැමිණි සියම් දූත පිරිස උපසම්පදාව පිහිටුවීමට අවශ්‍ය කටයුතු රාජ අනුග්‍රහයෙන් සම්පාදනය කළහ. ක්‍රි.ව 1753 ජූලි 14 වැනි දින ඇසළ පුර පසළොස්වක පොහෝ දින රාත්‍රි මෙරට උපසම්පදාව අපේක්ෂකයන්ට පූර්වාදර්ශයක් ලෙස සියම් අමාත්‍යවරයකු පැවිදි කිරීමෙන් පසු උපසම්පදා කරන ලදි.[46] එනමුත් *මන්දාරම්පුර පුවතේ* සඳහන් වන්නේ සාමණේර නමක් උපසම්පන්න වූ බවකි.

ප්‍රථමයෙන් සිදු කළ උපසම්පදාවට සහභාගි වූ පිරිස පිළිබඳ එකිනෙකට වෙනස් ආකාරයේ තොරතුරු දක්නට ලැබේ. කෙසේ වුවත් උපාලි තෙරුන් වහන්සේ උපාධ්‍යාය වශයෙන් ද බ්‍රහ්මජෝති සහ මහාපුඤ්ඤ යන තෙරවරුන් කම්වාගාචාර්‍ය වශයෙන් ද කටයුතු කර ඇත.[47] මුලින් පැහැදිලි කළ පරිදි උපසම්පදාව පිහිටුවනතෙක් සසුන රැක්කේ ගණින්නාන්සේ ය. එනිසා ම ලක්දිව මුල්ම උපසම්පදා වූ සාමණේර නම වූයේ කොබ්බැකඩුවේ ගණින්නාන්සේ ය.[48] ඉන් අවබෝධ වන්නේ ගණින්නාන්සේට ඒ යුගයේ දී සමාජයේ හිමිව පැවති වැදගත්කම විය යුතුය. පිළිවෙළින් වැලිවිට සරණංකර සංඝරාජ හිමි, හුලංගමුවේ හිමි, බඹරදෙණියේ හිමි, තිබ්බොටුවාවේ හිමි සහ අස්ගිරි විහාරයෙහි එවකට නායක පදවිය දැරූ නාවින්නේ උන්නාන්සේ උපසම්පත්තියෙහි පිහිටුවනු ලැබූහ.[49] කොටගම වාචිස්සර හිමියෝ තත්කාලීන මූලාශ්‍ර අනුව යමින් උපසම්පදාව සිදු වූ ආකාරය ගැන වෙනත් මතයක් දරති. එනම් කොබ්බැකඩුවේ ගණින්නාන්සේ ළඟට දෙවැන්නා වශයෙන් අස්ගිරි විහාරයෙහි නායක

නාවින්නේ ධම්මදස්සි හිමියන්ව උපසම්පදාවෙහි පිහිටවනු ලද බවකි.[50] මෙම මතය අපක්ෂාතී අදහසක් ලෙස පිළිගත හැකිය. තවද පෝයමළු විහාරයෙහි නායක හිමියන් පළමුවෙන් උපසම්පත්තිය ලද බවට සිතීමට පුළුවන. නමුත් උපසම්පදාව ගැන වාර්තා කොට ඇති කතුවරුන් බොහොමයක් මල්වතු විහාරයට අයත් හෝ පක්ෂපාති වූ බැවින් සෑම අවස්ථාවක ම ප්‍රමුඛ කොට මල්වතු විහාරය දක්වමින් අස්ගිරි විහාරය දෙවැනි කොට සලකන්නට ඇතැයි සිතීමට පුළුවන. සරණංකර සංඝරාජයන්ගේ ශාසනික මෙහෙවරෙහි උච්චතම ඵලය ලෙස දැක්විය හැක්කේ කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත යි.[51] අතීතයේ සිදු වූ වැරදි වර්තමානයේ දී නිවැරදි කර ගැනීමටත් අනාගතයේදී ඇතිවීම වළකාලීමටත් මේ කතිකාවත බෙහෙවින් උපකාරි විය.

බෞද්ධාගම විනාශ කිරීම පිණිස බටහිර ජාතීන් අනුගමනය කළ ක්‍රියාමාර්ගවලට නොබියව මුහුණ දෙමින්, සමකාලීන ආගමික අවශ්‍යතා දිවිහිමියෙන් ආරක්ෂා කිරීම යන අභියෝග ජයගත්තා ලද්දේ ගණින්නාන්සේ විසිනි. භික්ෂු ජීවිතයෙන් ඔවුන් ඉවත්ව සිටිය ද උන්වහන්සේලා විහාරස්ථාන කේන්ද්‍රගතව ඇතිවූ ඇතැම් ගැටලුවලට මුහුණ දෙමින් ශාසනික වත්පිළිවෙත් අවිච්ඡින්නව පවත්වාගෙන ඒම ඉතා වැදගත් වේ. උඩරට ප්‍රදේශයේ බුදුදහම විනාශ නොවී සුරක්ෂිත වූයේ ගණින්නාන්සේලා විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග නිසාය. එම ප්‍රදේශයේ ඔවුන් විසින් ආරක්ෂා කරන ලද ශාසනික පිළිවෙත් සරණංකර හිමියන්ගේ ආගමික කටයුතු මල්ඵලගැන්වීමට ද සෘජු වශයෙන් මහෝපකාරී විය.

# අන්ත ලිපි

---

1 නොක්ස්. රොබට්,<u>එදා හෙළදිව</u>, පරි. ඩේවිඩ් කරුණාරත්න, පිටු. 224.

2 වාචිස්සර,කොටගම,<u>සරණංකර සංඝරාජ සමය</u>, පිටු. 57.

3 <u>රුහුණු සංඝ සංවිධානය</u>, සංස්. පොළොම්මාරුවේ හේමසිරි,පිටු. 07.

4 නොක්ස්. රොබට්,<u>එදා හෙළදිව</u>, පරි. ඩේවිඩ් කරුණාරත්න, පිටු. 224.

5 ඉලංගසිංහ,මංගල, <u>මධ්‍යකාලීන ලංකාවේ ආගම</u>, පිටු.136.

6 ඉලංගසිංහ,මංගල, <u>මධ්‍යකාලීන ලංකාවේ ආගම</u>, පිටු. 137.

7 <u>එම</u> ,පිටු, 224.

8 සිල්වා, චාල්ස් ,ද, <u>ශ්‍රී සඟරජවත,</u> පිටු. 64.

9 Mirando, A.H. <u>*Buddhism in Sri Lanka in the 17th and 18th Centuries*</u>,p. 12-14.

10 වාචිස්සර,කොටගම <u>සරණංකර සංඝරාජ සමය</u>, පිටු, 60.

11 දේවරාජ, ලෝනා, ශ්‍රීමති. <u>උඩරට රාජධානිය</u>, පිටු. 231.

12 වාචිස්සර,කොටගම,<u>සරණංකර සංඝරාජ සමය,</u> එම.පිටු, 60.

13 <u>එම</u>, පිටු, 60.

14 සිල්වා, චාල්ස් ,ද ,<u>ශ්‍රී සඟරජවත</u>, පද්‍ය,64, පිටු .64.

15 <u>එම</u>, කවි ,59 - 60 , පිටු. 78.

16 <u>එම</u>, පද්‍ය,59 - 60 , පිටු . 78.

17 වාචිස්සර,කොටගම, <u>සරණංකර සංඝරාජ සමය</u>. පිටු. 59.

18 ගොන්සල්වේස්, ජාකොබ්, <u>බුදුබණ ප්‍රත්‍යක්ෂය</u>, පිටු .45.

19 වාචිස්සර,කොටගම, <u>සරණංකර සංඝරාජ සමය</u>. පිටු. 38.

20 ද සිල්වා, එම්.යු."17 - 18 සියවසෙහි ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල වූ ගණින්නාන්සේලා හා ඔවුන්ගෙන් බුද්ධ
ශාසනයට සහ දේශීය සංස්කෘතියට සිදු වූ සේවාව,<u>රෝහණ සඟරාව</u>,සංස්. පී. ඒ. දයාතිලක සහ වෙනත් අය,පිටු. 24.

21 අධිකාරි,අභයරත්න,<u>ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහ සඟන</u>, එම, පිටු, 223.

22 <u>එම</u>,පිටු, 223.

23 <u>මහාවංසය</u>, සංස්. හික්කඩුවේ සුමංගල සහ දොන් අන්ද්‍රිස් සිල්වා බටුවන්තුඩාවේ,පරි. 94, ගාථා. 194 .

24 Perera, S. G. <u>Life of Father Jacome Goncalves</u>. P. 17.

25 අබයසිංහ,ටිකිරි සහ වෙනත් අය, <u>උඩරට රාජධානිය 1470 - 1818</u>, පිටු .69.

26 අධිකාරි,අභයරත්න, ශ්‍රී ලංකාවේ සම්භාව්‍ය අධ්‍යාපනය හා මහ සඟන, පිටු. 223.

27 අභයසිංහ,ටිකිර සහ වෙනත් අය, උඩරට රාජධානිය 1470- 1818, පිටු .69.

28 Perera, S. G. Life of Father Jacome Goncalves. P.75.

29 Gunawardena,K.W."Dutch policy towards Buddhism in Sri Lanka and some Aspect of its Impact, C 1640-1740." Asian Panaromaessays in Asian History, past and present.Ed. De Silave, K.M. Sirma Kiribamune, and De Silva, C.R., p. 322.

30 ද ,සිල්වා, එම්.යූ."17 - 18 සියවසෙහි ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල වූ ගණින්නාන්සේලා හා ඔවුන්ගෙන් බුද්ධ ශාසනයට සහ දේශීය සංස්කෘතියට සිදු වූ සේවාව", රෝහණ සඟරාව, සංස්. පී. ඒ. දයාතිලක සහ වෙනත් අය, පිටු. 33.

31 එම, පිටු ,34.

32 සංඝරාජ සාධුචරියාව ,සංස්. හේනේපිටගෙදර පියනන්ද, පිටු. 7.

33 වාචිස්සර,කොටගම, සරණංකර සංඝරාජ සමය, පිටු. 60.

34 අභයසිංහ, පී.ඇම්.පී. උඩරට විත්ති, පිටු. 73-75.

35 ද, සිල්වා, එම්.යූ. "17 - 18 සියවසෙහි ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල වූ ගණින්නාන්සේලා හා ඔවුන්ගෙන් බුද්ධ ශාසනයට සහ දේශීය සංස්කෘතිය සිදු වූ සේවාව", රෝහණ සඟරාව, සංස්. පී. ඒ.දයාතිලක සහ වෙනත් අය පිටු. 34.

36 වාචිස්සර,කොටගම, සරණංකර සංඝරාජ සමය ,පිටු, 69.

37 එම, පිටු, 69.

38 Perniolo, V.Catholic Church in Sri Lanka, Portugues Period p.55.

39 Gunawardena,K.W."Dutch policy towards Buddhism in Sri Lanka and some Aspect of its Impact, C 1640-1740." Asian Panaromaessays in Asian History, past and present.ed.B. De Silave, and Others , C.R. p. 325.

40 ද සිල්වා, එම්.යූ."17 - 18 සියවසෙහි ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත්වල වූ ගණින්නාන්සේලා හා ඔවුන්ගෙන් බුද්ධශාසනයට සහ දේශීය සංස්කෘතිය සිදු වූ සේවාව", රෝහණ සඟරාව ,සංස්. පී. ඒ. දයාතිලක සහ වෙනත් අය පිටු.40.

41 ඤාණවිමල, කිරිඇල්ලේ, වේහැල්ලේ ධම්මදින්න ස්වාමීන්ද්‍ර ශාසන ඉතිහාසය, පිටු 15.

42 එම, පිටු 15 -16.

43 ගමගේ, ජේ. නිමල්, ලංකා භික්ෂු ශාසන ඉතිහාසය, පිටු. 47.

44 වනරතන, කඹුරුපිටියේ, මාතර පුරාවිද්‍යාත්මක ඉතිහාසය, පිටු. 218.

45 ඊට අදාළ තොරතුරු සඳහා දෙවන පරිච්ඡේදය බලන්න.

46 ජයරත්න,ඇල්.එස්. සහ ජයරත්න එස්. එම්. පිණ්ඩපාතික වැලිවිට සරණංකර සංඝරාජ මාහිමිපාණෝ සහ ශතාමවර්ණනාව, පිටු. 99-100.

47 වාචිස්සර, කොටගම,සරණංකර සංඝරාජ සමය, පිටු. 180.

48 සංඝරාජ සාධු චරියාව, සංස්. හෙන්පිටගෙදර පියනන්ද, පිටු. 28.

49 සීලක්ඛන්ධ,තුඹුල්ලේ,අස්ගිරි මහාවිහාරයේ ප්‍රභවය, විකාශය හා තදනුබද්ධ අධ්‍යාපන සම්ප්‍රදාය, පිටු. 147.

50 වාචිස්සර, කොටගම,සරණංකර සංඝරාජ සමය, පිටු. 181.

51 සුරවීර, ඒ.වී.සරණංකර කතිකාවත හා භික්ෂු සමාජය ,පිටු, 126-137.